සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2024 ජූලි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2024-08-18
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

  (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

  (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

  (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

  (5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

  (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** සීමාසහිත පොදු සමාගමක අවම කොටස්කරුවන් ගණන වන්නේ:

(1) 2 කි. (2) 1 කි. (3) 20 කි. (4) 50 කි.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, මිනිස් අවශ්‍යතාවයන් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) පාන්. (2) ආහාර.
(3) රැකියා සුරක්ෂිතභාවය. (4) කමිස.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, හොඳ මුදලක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) පිළිගැනීම. (2) කුඩා ඒකකවලට බෙදීමට හැකි වීම.
(3) කල් තබා ගත හැකි වීම. (4) රැගෙන යාමේ අපහසුතාවය.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, මුදල් වෙළෙඳපොළට සම්බන්ධ වන පාර්ශවයක් වන්නේ කවුද?

(1) රජය. (2) රක්ෂණ සමාගම්.
(3) වාණිජ බැංකු. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, පෝටර්ගේ පංචබල විශ්ලේෂණයේ (Porter's Five Forces analysis) බලවේගයක් **නොවන්නේ** කුමක් ද?

(1) කර්මාන්තයට අළුතෙන් ප්‍රවේශවන්නන්ගෙන් වන තර්ජනය.

(2) තරඟකරුවන්ගේ කේවල් කිරීමේ බලය.

(3) ආදේශක භාණ්ඩ මඟින් ඇතිවන තර්ජනය.

(4) සැපයුම්කරුවන්ගේ කේවල් කිරීමේ බලය.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, පුද්ගලයෙකුට රක්ෂණය කළ **නොහැකි** අවදානමක් තෝරන්න:

(1) ආර්ථික අවපාත නිසා සිදුවන අලාභ. (2) හදිසි අනතුරුවලින් ඇති විය හැකි අවදානම.

(3) තම ජීවිතය පිළිබඳ අවදානම. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.7** පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** ලියාපදිංචිය අවශ්‍ය නොවේ. **(b)** අඛණ්ඩ පැවැත්මක් නොමැත. **(c)** එහි අරමුණ දිගුකාලීන වේ.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, බද්ධ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වන්නේ:

(1) **(a)** පමණි. (2) **(b)** පමණි.

(3) **(a)** සහ **(b)** පමණි. (4) **(a)** සහ **(c)** පමණි.

**1.8** පහත සඳහන් ආයතන අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය **නොකරනු** ලබන්නේ කුමන ආයතනය ද?

(1) සේවක භාරකාර අරමුදල. (2) සේවක අර්ථසාධක අරමුදල.

(3) කල්බදු සමාගම්. (4) බලපත්‍රලාභී විශේෂිත බැංකු.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, විධිමත් ව්‍යාපාරයක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) ආර්ථික කටයුත්තක් වීම. (2) අවිනිශ්චිතතාවයන් නොපැවතීම.

(3) මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරුවක් තිබීම. (4) ලාභයෙන් අභිප්‍රේරණය වීම.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, මුදල් වෙළෙඳපොළෙහි උපකරණයක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) සාමාන්‍ය කොටස්. (2) භාණ්ඩාගාර බැඳුම්කර.

(3) වාණිජ පත්‍රිකා. (4) ඉහත සඳහන් සියල්ලම.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති, නෛතික අනන්‍යතාවයන් සහ සීමිත වගකීමක් සහිත ව්‍යාපාර සංවිධානයක් සංස්ථාපිත සමාගමක් යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1.12** සේවක අර්ථසාධක අරමුදල [Employees' Provident Fund (EPF)], තත්කාලීන දළ පියවීමේ පද්ධතියට [Real Time Gross Settlement System (RTGS)] සහභාගිවන්නෙක් වේ.

**1.13** චෙක්පතක් යනු ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිත කරන ගෙවීම් ක්‍රමයකි.

**1.14** දැක්ම (vision) යනු සංවිධානයක් වෙනත් සමාන ආයතනයන්ගෙන් වෙනස් වන්නේ කෙසේද යන්න විස්තර කරනු ලබන ප්‍රකාශය වේ.

**1.15** හානිපූර්ණය (indemnity) මූලධර්මයට අනුව, රක්ෂණයෙන් ලාභ ඉපැයීම වළක්වනු ලැබේ.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** ව්‍යාපාරයකට බෙදාහැරීමේ මාර්ගයකින් ඇති වාසි දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** "හරිත ව්‍යවසායකත්වය" (Green Entrepreneurship) යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** "ප්‍රාග්ධන වෙළෙඳපොළ" සහ "මුදල් වෙළෙඳපොළ" අතර වෙනස්කම් දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** චෙක්පතක් අගරු විය හැකි ආකාර දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** ව්‍යවසායකයෙකු සහ කළමනාකරුවෙකු අතර, වෙනස්කම් දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**අමිල** විසින් වසර කිපයකට පෙර **අමිල බේකර්ස්** නමින් තනිලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. පසුව, **බිලිත**, **අමිල** සමඟ සම්බන්ධ වූ අතර ඔවුන් විසින් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ **සීමාසහිත ටේස්ටි බේකර්ස් (පෞද්ගලික) සමාගම** නමින් බේකරියක් සංස්ථාපනය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සීමාසහිත පෞද්ගලික සමාගම් හැරුණුකොට 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ හැකි සමාගම් වර්ග දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) පහත සඳහන් මූලික ලක්ෂණ මත පදනම්ව, තනිලස්වාමි ව්‍යාපාරයක් සහ වගකීමෙන් සීමිත සමාගමක් අතර වෙනස්කම් **සඳහන් කරන්න**:

(i) නීතිමය පුද්ගලභාවය. (ii) පාලනය.

(iii) අඛණ්ඩ බව. (iv) ගිණුම්කරණය සහ විගණනය. (ලකුණු 04)

(c) සීමාසහිත පෞද්ගලික සමාගමක වාසි දෙකක්(02) සහ අවාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

2015 දී **රශ්මි** විසින් **හැන්ඩි ස්ටයිල්** නමින් රෙදිපිළි සාප්පුවක් ආරම්භ කරන ලදී. **හැන්ඩි ස්ටයිල්** තම ගනුදෙනු සඳහා චෙක්පත් සහ ව්‍යවහාර මුදල් (currency) භාවිත කරන ලදී. කෙසේවෙතත්, කොවිඩ්-19 වසංගතයත් සමඟ ව්‍යාපාරයේ සියලුම ගනුදෙනු මාර්ගගත ක්‍රමයට (online) සිදුකිරීමට **රශ්මිට** සිදුවිය. වර්තමානයේදී ඇය විසින් සියලුම ගනුදෙනු, විද්‍යුත් මුදල් [electronic money (E-money)] භාවිතයෙන් සිදුකරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "ව්‍යවහාර මුදල්" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න **නිර්වචනය කරන්න.** (ලකුණු 02)

(b) චෙක්පතක් ලිවීමේදී සළකා බැලිය යුතු කරුණු හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(c) ගනුදෙනු කිරීමේදී, විද්‍යුත් මුදල් ජනප්‍රිය ක්‍රමයක් වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**ඩිගිත්** ට අයත් දේශීය මුද්‍රණ ආයතනයක් වන **ඩිගිත් ප්‍රින්ටර්ස්,** ශ්‍රී ලංකාව තුළ ඇති කුඩා ව්‍යවසායකත්ව ව්‍යාපාරයකි. කෙසේවෙතත්, ඩිජිටල් මුද්‍රණ කර්මාන්තයේ පාරිසරික බලපෑම අවම කිරීම පිණිස **ඩිගිත්** ඔහුගේ කාර්යභාරය අවබෝධ කරගෙන සිටියි. ආයතනයේ මෙම භාවිතයන් රජයේ මෑත කාලීන ප්‍රවේශයන් සමඟ සමපාත වන අතර, එමගින් පරිසර හිතකාමී ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට හැකිවනවා සේම, ව්‍යාපාරය සහ සමාජය යන දෙපාර්ශවයටම ප්‍රතිලාභ ලැබෙන තත්ත්වයක් උදාකරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) රජයේ අරමුණු තුනක්(03) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 03)

(b) **ඩිගිත් ප්‍රින්ටර්ස්** විසින් සමාජයට ඉටුවිය යුතු වගකීම් තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(c) කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් [Small and Medium Enterprises (SMEs)] ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**තරුෂ්** ට අයත් කේවලස්වාමී ව්‍යාපාරයක් වන **තරුෂ් ෆනිචර්**, ගෘහ භාණ්ඩ ව්‍යාපාරයකි. ගෘහ භාණ්ඩ සෑදීම සඳහා අවශ්‍ය මූලික අමුද්‍රව්‍යයක් වන දුර්ලභ වර්ගයේ දැව වර්ගයක් ඉන්දුනීසියාවෙන් ව්‍යාපාරය මගින් ආනයනය කරනු ලබයි. කාලගුණ වෙනස්වීම්, දැව කර්මාන්ත ආශ්‍රිත ව්‍යාපාරයන්ට බාධා පමුණුවන අතර, දැව මිල ගණන් සහ සැපයුම් දාමයට බලපෑම් කරනු ලබයි. **තරුෂ්** විසින් දේශීයව ඉක්මණින් වැවෙන උණ ගසක් නව විකල්ප අමුද්‍රව්‍යයක් වශයෙන් හඳුනාගෙන ඇති අතර, එමගින් ආනයන මත රඳා පැවැත්ම අඩු කරනු ලබයි. මෙම නවෝත්පාදනය මගින් ව්‍යාපාරයේ ස්ථාවරත්වය තහවුරු කරන අතර, වෙනස්වන ගෝලීය පරිසරයට අනුගතවීමේ වැදගත්කම ඉස්මතු කෙරේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තොග වෙළඳාම සහ සිල්ලර වෙළඳාම අතර, වෙනස්කම් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) **තරුෂ් ෆනිචර්** හට ගෝලීය පරිසරයේ ඇති බලපෑම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **තරුෂ්** සතු ව්‍යාවසායකත්ව ගුණාංග හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

මෑතකදී උපාධිය ලබාගත් තරුණ ව්‍යවසායිකාවක් වන **මාලිකා,** ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී පිරිසිඳු කිරීමේ සේවාවන් සඳහා වෙළෙඳපොළේ ඇති හිඩසක් නිරීක්ෂණය කරන ලදී. ඇයගේ ව්‍යවසායකත්වය පිළිබඳ ඇති උනන්දුව නවෝත්පාදනයන්ට මග පාදනු ලබයි. වාණිජ ගොඩනැගිලි සඳහා වන තිරසාර නිෂ්පාදන සහ ප්‍රවේශයන් භාවිතය සඳහාම කැප වූ සමාගමක් ලෙස **"Eco-Clean"** ආයතනය ඇය විසින් ආරම්භ කරන ලදී. මෙය වඩාත් තිරසාර අනාගතයක් සහ ආර්ථික වර්ධනයන් සඳහා දායක වේ.

**Eco-Clean** ආයතනය විවිධ වූ උපකාරක සේවාවන් සැපයීම මගින් සාර්ථකත්වයට පත්ව ඇත. අවශ්‍ය උපකරණ සහ ප්‍රවර්ධන කටයුතු සඳහා ආයෝජනය කර ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා **මාලිකා** ට බැංකු විසින් ණය පහසුකම් ලබාදෙන ලදී. **Eco-cleans** හි ශක්තිමත් මාර්ගගත ක්‍රමවේදය සහ හරිත ගොඩනැගිලි ප්‍රවේශයන් සමග ඇති හවුල්කාරීත්වය නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරගන්නා අතර, සන්නාමය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නංවයි. තවද, **මාලිකා** විසින් පාරිසරික රෙගුලාසිවලට අනුකූලවීම සහතික කිරීම සඳහා නීති උපදෙස් සොයන අතරතුර, ව්‍යාපාරයේ වියහැකි අවදානම් රක්ෂණය මගින් ආරක්ෂා කෙරේ.

කෙසේවුවද, ඇය තම විශ්ව විද්‍යාලයෙන් ලබාගත් ව්‍යාපාර කළමනාකරණ දැනුමට අනුව, ව්‍යාපාර ලෝකය තුළ සැරි සැරීමට විවිධ වූ ඇල්මැති පාර්ශවයන් සහ ඔවුන්ගේ බලපෑම් පිළිබඳ අවබෝධයන් අවශ්‍ය බව ඇය දැන ගත්තාය. ඒ අනුව, ඇය, ඇයගේ ඇල්මැති පාර්ශවයන් සහ ඒවායේ බලපෑම පිළිබඳ දත්ත එකතු කරන ලදී. පරිසර හිතකාමී ව්‍යාපාර **Eco-Clean** හි පාරිසරික නැඹුරුව කෙරෙහි අවධානය යොමුකොට ඇති බවත්, එය සන්නාමයේ කීර්තිනාමය සහ පාරිභෝගික පක්ෂපාතීත්වය වැඩි කිරීමට හේතුවන බවත් ඇය විසින් තේරුම්ගෙන ඇත. තවද, අතෘප්තිමත් පාරිභෝගිකයින්ට ඍණාත්මක සමාලෝචනයන් මගින් ඔවුන්ගේ කීර්තිනාමයට හානි පැමිණවීමටද පුළුවනි. කාර්යක්ෂම පිරිසිඳු කිරීමකට සහ පාරිභෝගික තෘප්තිය සහතික කිරීම පිණිස හොඳින් පුහුණු වූ සහ අභිප්‍රේරණය වූ ශ්‍රම බලකායක අවශ්‍යතාවයන් ඇත. කෙසේවුවද, රටේ පවත්නා ආර්ථික තත්ත්වය හේතුකොටගෙන ඉතා ඉහළ සේවක පිරිවැටුම් අනුපාතයක් (employees' turnover rate) පවත්වා ගැනීමේ වැඩි ඉඩකඩක් පවතින අතර, මෙය මෙහෙයුම් කටයුතුවලට බාධා වීමටත් ගුණාත්වය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට ද හැකිය. ඇයගේ බොහෝ සැපයුම්කරුවන් පරිසර හිතකාමී පිරිසිඳු කිරීමේ නිෂ්පාදනයන් විශ්වාසවන්තව සපයනු ලැබේ. කෙසේවුවද, විශ්වාසවන්ත නොවන සැපයුම්කරුවන් මගින් තොග හිඟවීම සහ සේවා බාධාවීම්වලට මගපාදනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශදුඅත (SWOT) විශ්ලේෂණය භාවිතයෙන් **Eco-Clean** හි ව්‍යාපාර පරිසරය **තක්සේරු කරන්න.** (ලකුණු 06)

(b) **Eco-Clean** හි ඇල්මැති පාර්ශවයන් (stakeholders) හතරදෙනෙකු(04) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(c) ණය ලබාදීම හැරුණු විට ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ව්‍යාපාරවලට සපයනු ලබන සේවාවන් හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(d) **Eco-Clean** ආයතනයට රක්ෂණය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(e) **Eco-Clean** හි මූලික ව්‍යාපාරික කටයුතුවලින් ඔබ්බට ගොස් ඔවුන්ට ශ්‍රී ලංකාවේ වඩාත් තිරසාර අනාගතයකට දායක විය හැකි ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
| --- | --- | --- | --- |
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
| --- | --- | --- | --- |
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
| --- | --- | --- | --- |
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
| --- | --- | --- | --- |
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |